# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,219—1960 ඔක්තෝබර් 28 වැනි සිකුරාදා—28.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය-සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 941 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | 942 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | 942 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 943 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 944 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 944 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

### 1960 අංක 457

අ. ආ. කා. අංකය : සී. 118/47.

ස්වකීය තනතුරු වාරය අවසානවීමෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික හා සභාපතිවූ, සී. ඇම්. ජී. නාමෝපලක්ෂිත, ශ්‍රීමත් එරික් ජැන්ස් මහතා දැරූ තනතුර අත් හැරීම හේතුකොට ගෙන ඇතිවූ පුරප්පාඩුව පිරවීම් සඳහා, අග්‍රාණ්ඩුකාරතුමා විසින්, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 58 වැනි වගන්තිය යටතේ, 1960වෙ ඔක්තෝබර් 24 වැනි දින සිට, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් ගිනිගේ සිරිල් තේන් ආතර් ද සිල්වා මහතා පත් කල බව, දැනුම් දෙනු ලැබේ.

තවද, අග්‍රාණ්ඩුකාරතුමා විසින්, එකී ගිනිගේ සිරිල් තේන් ආතර් ද සිල්වා මහතා 1960වේ ඔක්තෝබර් 24 වැනි දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කල බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 ඔක්තෝබර් 24 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදී.

10-856

### 1960 අංක 458

අංකය : ඩී/වීඑෆ්/33 ඒ.

**යුධ හමුදාව—ලංකා ස්වේච්ඡා භට සේනාව— අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ජූලි මස 1 වැනි දින සිට පහත සඳහන් මහත්වරුන් යුධ හමුදාවේ ස්වේච්ඡා භට සේනාවේ උප ලෙප්ටිනන්ට් වරුන් වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරවලට පත්කිරීම සහ ඔවුන් 1 වැනි (ස්වේච්ඡා) ගැමුණු රෙජිමේන්තුවට ඇතුලත් කිරීම අනුමත කොට තිබේ.

අර්වින් ස්ටීවන් විලියම්ස් මහතා,
ගාමිණී ලක්ස්මන් තම්මිට මහතා,
උපසේන වෙත්තසිංහ මහතා,
නිමල් මහේන්ද්‍ර තම්මිට මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 14 දින,
කොළඹ දීය.

10-657

1960 අංක 459

අංකය : ඩී. 3/රෙක්ට්/46.

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත් කිරීමක්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට පහත සඳහන් කරන ලද මහතා රාජකීය ලංකා ගුවන් හමුදාවේ ප්ලයිට් ලෙප්ටිනන්ට් කෙනෙකු වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත් කිරීම සහ ඔහු එම සේවයේ දන්ත ශාඛාවට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ.

ෂෙල්ටන් වියුරින් ඈනස්ලි ද මැල්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 12 දින,
කොළඹදීය.

10-598.

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 460

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය:—

ඒ. 49/59.

1960 සැප්තැම්බර් මස 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන්පත් ඇල්. ඇස්. බී. පෙරේරා මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව පුරාවිද්‍යා කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 137/57.

1959 සැප්තැම්බර මස 6 වැනි දින සිට රාජනීතිඥ ඒ. ඩබ්ලිව්. එච්. අභයසුන්දර මහතා නීති කෙටුම්පත්කරු වශයෙන්.

ර්. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ඔක්තෝබර මස 24 වැනි දින,
තැ. පෙ. 500, කොළඹ 1,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

10-836

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 461

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ යි:—

අංකය. ජේඒ. 12/48.

ඩී. විමලරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 ඔක්තෝබර් 14 වැනි දින සිට, කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 27,298/ඒ නඩුවේ තීන්දුව දීමට, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය. ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. බැස්ටියන්ස් මහතා 1960 ඔක්තෝබර් 22 වැනි දින, මාතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර 'ධුරයට.

අංකය. ජේඑල්. 12ඒ/57.

කේ. සී. ර්. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1960 ඔක්තෝබර් 21 වැනි දින සිට 24 වැනි දින දක්වා, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය. ජේඑල්. 67ඒ/59.

ඩබ්ලිව්. ඩී. නාමෝතරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා 1960 ඔක්තෝබර් 18 වැනි දින සිට 24 වැනි දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපනේ මහෙස්ත්‍රාත් ධුරයට, හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය. ජේඒ. 34/48.

ඒ. අයි. අබේවික්‍රම මහතා 1960 ඔක්තෝබර් 21 වැනි දින සිට, කෑගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 30,759 නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය. ජේඑල්. 45/48.

වී. ටී. පණ්ඩිත ගුණවර්මන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1960 ඔක්තෝබර් 21 වැනි දින, බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය. ජේඑල්. 26/58.

ඒ. ඩී. ජේ. ගුණවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා 1960 ඔක්තෝබර් 21 වැනි දින, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය. ජේඑල්. 70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බතෝලමියුස් මහතා 1960 ඔක්තෝබර් 19 වැනි දින සිට 21 වැනි දින දක්වා, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය. ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ර්. සී. විජේතුංග මහතා 1960 ඔක්තෝබර් 24 වැනි දින සිට, මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මාතර අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය. ජේඑල්. 2ඒ/56.

සී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ආර්. ද අල්විස් මහතා 1960 ඔක්තෝබර් 20 වැනි දින, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය. පීඑල්/එම්.3/48.

එච්. මීදෙණිය මහතා නැති අතර, ඩී. බී. ඩිරෙක්ස් මහතා 1960 ඔක්තෝබර් 14 වැනි දින, කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල්, පරණකුරු, ගල්බොඩ හා කිණිගොඩ කෝරලයන්හි ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය. පීඑල්/එම්.3/48.

එච්. මීදෙණිය මහතා නැති අතර, ර්. ජී. බී. පෙරේරා මහතා 1960 ඔක්තෝබර් 17 වැනි දින, කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල්, පරණකුරු ගල්බොඩ හා කිණිගොඩ කෝරලයන්හි ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය. පීඑල්/ඒ.5/53.

ඒ. බී. අළුවිහාරෙ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සේනානායක මහතා 1960 ඔක්තෝබර් 14 වැනි හා 15 වැනි දිනයන්හි, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරලේ, පහත බුලත්ගම, ඇතුළුගම් හා පනාවල් කෝරලයන්හි ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා බෙලිගල් හා කුරුවිටි කෝරලයන්හි ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පී.ඒ. 16/57.

ඒ. ආර්. එච්. බැරි මහතා 1960 ඔක්තෝබර් 26 වැනි දින, නාගොඩ ගම්බද උසාවියේ අංක සීආර්එම්. 3,425 එන්. නඩුව ඇසීමට, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගගබොඩ හා හිණිදුම් පත්තු ගම්බද උසාවියේ හා වැල්ලබඩ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 3/48.

සී. ටී. කාසිනාදර් මහතා 1960 ඔක්තෝබර් 13 වැනි දින, මඩකලපු දිස්ත්‍රික්කයේ, ඒරාවූර් කෝරලේ, බින්තැන්න පත්තුවේ හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වී. 1/48.

එස්. වෙලෙමුරුගු මහතා නැති අතර, ටී. මයිල්වාගනම් මහතා 1960 ඔක්තෝබර් 20 වැනි දින, වවුනියා සහ මන්නාරම් දිස්ත්‍රික්කවල, දකුණු වවුනියාවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා මාන්තෙයි ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57.

එස්. ඒ. සී. එම්. මීරා සයිබො මහතා 1960 ඔක්තෝබර් 25 වැනි දින, කල්මුනේ ගම්බද උසාවියේ අංක සිවිල් 448 හා සීආර්එම්. 1,193 නඩු ඇසීමට, මඩකලපු දිස්ත්‍රික්කයේ, කරවාකු, නින්තාවූර්, සමන්තුරේ හා වැවුගම් පත්තු ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 3/48.

එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1960 නොවැම්බර් 1 වැනි දින සිට 5 වැනිදින දක්වා, 7 වැනි දින සිට 11 වැනි දින දක්වා, 14 වැනි දින සිට 19 වැනි දින දක්වා; 21 වැනි දින සිට 26 වැනි දින දක්වා, හා 28 වැනි දින සිට 30 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරනතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ, ඒරාවූර් කෝරලේ, බින්තැන්න පත්තුවේ හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ඔක්තෝබර් 20 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායාීලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

10-752

# වෙනත් පත් කිරීම්

**1960 අංක 463**

අංකය : ඞී. 33/ඉරක්ව්

## රාජකීය ලංකා ගුවන් හමුදාවේ උසස් කිරීම්

1960 නොවැම්බර් මස 1 වැනි දින සිට ප්ලයිං ඔපිසර්වරුන් වශයෙන් :—

| | | | |
|---|---|---|---|
| නියමු නිලධාරි | ඇෆ්. ඩබ්ලිව්. පෙරෙයිරා | (01090) | ලේඛක |
| නියමු නිලධාරි | ඞී. ඇම්. වික්‍රමරත්න | (01091) | ලේඛක |
| නියමු නිලධාරි | ඞී. බී. සිරිවර්ධන | (01092) | ලේඛක |
| නියමු නිලධාරි | ජේ. ඇල්. ආර්. ගුණතිලක | (01093) | ලේඛක |

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 14 දින,
කොළඹ දීය.

10-656

**1960 අංක 464**

අංකය : ඕඇම්. 4/1/11 ඇෆ්. (ii)

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම පහත දැනුම් දී ඇති දිනයේ සිට බල පැවැත්වේ :—

1960 සැප්තැම්බර මස 15 වැනි දින සිට නැවත නියම කරණ තුරු, ලංකා විදේශ සේවයේ සිව්වෙනි පෙලේ ඒ. ටී. ජයකොඩි මහතා බුරුමයේ ලංකා දූත මණ්ඩල කාර්යාලයේ තෙවෙනි ලේකම් වශයෙන්.

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම්.

1960 ඔක්තෝබර් 21 දින,
උත්තර මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ල,
කොළඹ 1.

10-779

**1960 අංක 465**

කහවලගේ ඩොලී ක්‍රියාලතා සේනාරත්න මහත්මිය බිංගිරියේ වාසස්ථානය සහ කාර්යාලය ද හෙට්ටිපොල අතුරු කාර්යාලය ද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් වරියක වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
කර්මාන්ත, සවදෙශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 සැප්තැම්බර මස 27 වෙනි දින,
කොළඹ දීය.

10-747

**1960 අංක 466**

අංකය : ඒ. ඇම්. 2/1/54.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍ය වරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

සිසිල් ඊ. පෙරේරා මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු සහ නිලනොලත් මහේස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,

ආර්. සී. පෙරේරා මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

එච්. ඒ. ද සේරම් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

ඇම්. බී. බට්ලර්-කෝල් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

ඇල්. ඩබ්ලිව්. පෙරේරා මහතා නුවරඑලිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

ඊ. ජේ. සැමුවල් මහතා චාවකච්චේරියේ පවත්වන පේදුරුතුඩුව දිස්ත්‍රික් උසාවියේ අතිරේක සෙක්‍රතාරිස් ධුරය දරණ කාලය තුල පේදුරුතුඩුව අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද, පත් කර ඇත්තේ ය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගේ නිවේදනයකින් සංශෝධනය කරණලද 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් එම සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිව්රුම් සහතික කිරීම පිණිස මහනුවර පිස්කල් කායඞාලයේ ලිපිකාර කේ. පී. ආර්. චන්ද්‍රසේන මහතා 1960 ඔක්තෝබර් මස 18 වෙනි දින සිට හැටන් පිස්කල් මාර්ෂල් තැන වශයෙන් වැඩබලන කාලය තුළ හැටන් අධිකරණ කොට්ඨාශයට විශේෂ නිලධාරියෙක් වශයෙන් පත්කර ඇත්තේ ය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1960 ඔක්තෝබර් මස 11 වෙනි දින සිට වී. සෙල්ලදොරේ මහතා නැවත වැඩ භාරගන්නාතුරු යාපනේ දිස්ත්‍රික්කයේ අලෙයිපිඩ්ඩි සහ මන්ඩෙයිතිව් කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එස්. රත්නසභාපති මහතා ද.

1960 ඔක්තෝබර් මස 12 වෙනි දින සිට කේ. ඒ. ද එස්. ආර්. විජේසිංහ මහතා නැවත වැඩ භාරගන් නාතුරු ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ මාදම්පේ, අම්බලන්ගොඩ, බලපිටිය සහ කරන්දෙනිය සහ බෙන්තර වලල්ලවිටිකෝරළේ වැලිතර, කොස්ගොඩ සහ ඌරගහ යන විද්‍යාත ආරච්චි කොට්ඨාශවල සහ ගාලු දිස්ත්‍රික්කයේ පිටිගල, ඇල්පිටිය සහ ඕපාත කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට බී. ඒ. අසලාරච්චි මහතාද,

1960 ඔක්තෝබර් මස 13 වෙනි දින සිට පී. එල්. පැට්රික් මහතා නැවත වැඩ භාරගන් නාතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරයෙහි වැඩ බලන කාලයතුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට බී. ඒ. ජේ. කාසිනාදර් මහතා ද,

1960 ඔක්තෝබර් මස 14 වෙනි දින සිට ඩබ්ලිව් .එම්. ඒ. විජේරත්න බණ්ඩා මහතා නැවත වැඩ භාරගන් නාතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ වැව්ගම් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරයෙහි වැඩබලන කාලයතුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. නල්ලෙයිනාදන් මහතා ද,

1960 ඔක්තෝබර් මස 18 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරණතුරු මාතර දිස්ත්‍රික්කයේ වැලිගම නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එම්. අබේසූරිය මහතා ද පත්කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 24 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.
10-823

# ආණ්ඩුවේ නිවේදන

අංකය : 34/2/11(ඒසී)

## මුදල් බදු ආඥපනත

### 76 වැනි වගන්තිය යටතේ රෙගුලාසිය

1947 සැප්තැම්බර් මස 24 වැනි දිනය සහ 9,773 වැනි අංකය දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ ප්‍රකාශනයෙන් මඳක් සංශෝධිත (187 වැනි පරිච්ඡේදය වන) මුදල් බදු ආඥපනතේ 76 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සම්පාදිතව, යථොක්ත ප්‍රකාරයට මඳක් සංශෝධිතවූ එකී 76 වැනි වගන්තිය යටතේ උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසිය යි.

ෆිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක,
මුදල් අමාත්‍ය.

1960 ක්වූ ඔක්තෝබර් මස 20 දින,
කොළඹ දී ය.

රෙගුලාසිය

1944 ජූනි මස 19 වැනි දිනය සහ 9,284 වැනි අංකය දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබ, 1959 අගෝස්තු මස 7 වැනි දිනය හා 11,828 වැනි අංකය දරන ගැසට් පත්‍රයේ පළවූ රෙගුලාසියෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද්ද වූ, 1944 මුදල් බදු (ආණ්ඩුවේ ස්කන්ධ ආපසු භාරදීමෙන් ගෙවීම පිළිබඳ) රෙගුලාසි, එකී රෙගුලාසිවලට යා කොට ඇති උපලේඛනය පහත සඳහන් පරිදි වෙනස් කිරීමෙන් තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) 54 වැනි විෂය අංකය ළඟට, පහත සඳහන් අළුත් විෂය අංකයන්, ඒ එක් එක් විෂය අංකයෙහි ඇතුළත් විස්තර එම උපලේඛනයෙහි නියමිත තීරුවල සටහන් වන ලෙස, එකතු කිරීමෙන් :—

| | " I වැනි තීරුව | II වැනි තීරුව |
|---|---|---|
| 55. | සම මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 3½% ණය, 1980–84 ... ... ... | — |
| 56. | සම මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 3½% ණය, "බී" කාණ්ඩය, 1980–84 ... ... | — |
| 57. | සම මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 3½% ණය, 1975–79 ... ... ... | — |
| 58. | සම මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 3½% ණය, 1976–80 ... ... ... | — |
| 59. | සම මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 3½% ණය, "බී" කාණ්ඩය, 1976–80 ... ... | — |
| 60. | සම මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 3½% ණය, "සී" කාණ්ඩය, 1976–80 ... ... | — |
| 61. | අව මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 2¾% ණය, 1965–67 ... ... ... | 100 " ; සහ |

(ආ) පහත සඳහන් විෂය අංකයන්, ඒ එක් එක් විෂය අංකයට ඇතුළත් එම විස්තර එම උප ලේඛනයෙහි නියමිත තීරුවලින් ඉවත් කෙරෙන ලෙස, අස් කිරීමෙන් :—

| | " I වැනි තීරුව | II වැනි තීරුව |
|---|---|---|
| 18. | සම මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 3% යුද්ධ ණය, 1959–69 ... ... | — |
| 21. | සම මිලට නිකුත් කළ, ලංකාණ්ඩුවේ 2½% ජය ග්‍රහණ ණය, 1955–60 ... ... | — " |

10–854

## දැන්වීමයි

මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් වන්නිආච්චි කංකානන්ගේ චන්ද්‍ර කුමාර විජය ගුණවර්ධන මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අවසර දී තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 ඔක්තෝම්බර මස 11 වැනි දින,
කොළඹ දීය.

10-746

## 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

### 4 (1) වෙනි වගන්තිය යටතේ නියෝගය

අංක 157

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) වෙනි වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, කවරෙකු විසින් හෝ ආහාර පාලක විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක බලය යටතේ හා එම අවසර පත්‍රයේ ආකාරයට හැර, කිසියම් බැටළුවෙකු හෝ එළුවෙකු මේ රටට ගෙන්වීම, වාණිජ, වෙළඳ, ආහාර හා නැව් පිළිබඳ ඇමති නැන්පත් රිකිරි බංඩාර ඉලංගරත්න වන මම මෙම නියෝගයෙන් තහනම් කරමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් පිළිබඳ ඇමති.

1960 ඔක්තෝබර් මස 20 දින,
කොළඹදීය.

10-744

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මාතලේ දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1961 අවුරුද්ද සඳහා අළුත් කිරීම

මාතලේ දිස්ත්‍රික්කයේ රිවෝල්වර් සහ පිස්තෝල බලපත්‍ර හැර අනිත් තුවක්කු බලපත්‍ර 1961 අවුරුද්ද සඳහා අළුත් කිරීම ඒ ඒ කොට්ඨාශ වල ප්‍රාදේශීය ආදායම් නිලධාරි තුමන් විසින් 1960 නොවැම්බර් මස 15 වෙනි දින සිට කරනු ලබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. රිවෝල්වර් සහ පිස්තෝල බලපත්‍ර අළුත් කිරීම මාතලේ කච්චේරියේදී ඉහත සඳහන් දින පටන් කරනු ලැබේ.

2. තුවක්කු සඳහා දී ඇති සෑම බලපත්‍රයක්ම 1960 දෙසැම්බර් මස 31 වෙනි දාට පෙර 1961 අවුරුද්ද සඳහා අළුත් කර ගන්නා ලෙස අවවාද වශයෙන් දන්වනු ලැබේ. බලපත්‍ර අළුත් කිරීමේදී පරණ බල පත්‍ර ද සෝදිසි කිරීම පිණිස එම තුවක්කුද ඒ ඒ නිලධාරි වෙත ඉදිරිපත් කල යුතුය.

3. යමෙකු 1960 දෙසැම්බර් මස 31 වෙනි දිනට ප්‍රථම බලපත්‍ර අළුත් කර නොගන්නෙහි නම්, එවැනි බල පත්‍රයක් නියමිත කාලයෙන් පසුව අළුත් කිරීමේදී බලපත්‍ර ගාස්තු මුදලින් 100ක අතිරේක දඩ මුදලක් ගෙවා අළුත් කරගන්නට සිදුවේ. යම් කිසි හේතුවක් නිසා බලපත්‍රයක් අළුත්කර නොගන්නෙහි නම් එම බලපත්‍රයද තුවක්කුව ද බලපත්‍ර නිකුත් කරන නිලධාරි වෙත 1960 දෙසැම්බර් මස 31 වෙනි දින හෝ ඊට පෙර භාරදිය යුතුය.

4. 1960 වර්ෂයට නිකුත් කරණ ලද තුවක්කු බලපත්‍රයක් බලපත්‍ර නිකුත් කරණ නිලධාරි තුමාට භාරදීම පිණිස යමෙකු ලඟ නැත්නම් එවැනි බලපත්‍රයක සහතික පිටපතක් සඳහා නියමිත බලපත්‍ර ගාස්තු වට තවත් වැඩිපුර රුපියලක් ද ගෙවන්ට සිදුවේ.

5. 1961 මාර්තු 31 වෙනි දිනට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත් කර නොගන්නා අයට විරුද්ධව නඩු පවරන බවද සැලකිය යුතුයි.

වී. ජී. ඒ. පෙරේරා,
මාතලේ දිසාපති සහ බලපත්‍ර නිකුත් කිරීමට
බලය ලත් නිලධාරි තැන.

1960 ඔක්තෝබර් මස 20 වැනි දින,
මතාලේ දිසාපති කායබිලයේදීය.

10-768

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.